056112
ML/PR
2017/12/09
0056

# දකුණු පළාතේ දේව ශාන්තිකර්මයන්හි ප්‍රාදේශීය විශේෂතා

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වනු ලබන ප්‍රාසංගික කලාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධය යි.

නම :- විදාන ගමගේ සුසන්ත

අංකය :- DD/MA/DA/09/023

අධ්‍යයන වර්ෂය :- 2014

UVPA - Lib. Main
056112

පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

056112

# ප්‍රවේශය

දකුණු පළාතේ දේව ශාන්තිකර්මයන් හි ප්‍රාදේශීය විශේෂතා නම් වූ මෙම නිබන්ධයේ විෂය ක්ෂේත්‍රය විෂය පරික්ෂණය හා පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටි හැඳින්වීමක් ප්‍රවේශය යටතේ මෙහිලා අන්තර්ගත කිරීමට අපේක්ෂා කෙරේ. දේව ඇදහිලි මුල් කොට ගත් විවිධ චාරිත්‍ර වාරිත්‍ර මානව සමාජය ආරම්භයේ සිට ම පැවත එන්නකි. ඒවා ඒ ඒ රටවලට ආවේණික විවිධ සංස්කෘතීන් අනුව වෙනස් වේ. එමෙන් ම ඇතැම් රටවල්වලට අයත් පළාත් හා ප්‍රදේශ අනුව ද වෙනස්වීම නොවැලැක්විය හැකි ය. මෙම සංසිද්ධිය ශ්‍රී ලංකාවේ දකුණු පළාත් ආශ්‍රිත වැසියන් කෙරෙහි ද බෙහෙවින් බලපා ඇත. ලෞකික දිවියේ විවිධ පරමාර්ථ / අපේක්ෂා ඉටු කරගැනීම හා සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් පවත්වනු ලබන විවිධ ශාන්තිකර්ම අතර මඩු තොත්‍ර හෙවත් දෙවියන් මුල්කොට පවත්වන ශාන්තිකර්ම ද පවතී. කතරගම, නාථ, පත්තිනි ආදී ඇතැම් දෙවිවරු ඇදහීම දිවයිනේ විවිධ පළාත්වල දී මෙන් ම දකුණු පළාතේ ද ව්‍යාප්ත ය. උක්ත දෙවිවරු හැරුණු විට ප්‍රාදේශීය වශයෙන් පුද ලබන සමන්, නාථ, රජ්ජුරු බණ්ඩාර, මංගර, දෙවොල් ආදී දෙවිවරු ද ශ්‍රී ලංකාවේ පහතරට වැසියන් අතර ද බහුජන වන්දමානයට ලක් ව තිබේ. ඒ අතර ලාංකිකයන් අතර ප්‍රචලිත සමස්ත දේව මණ්ඩලයම චත්පිලිවෙත් හා පුද පූජා අඩු වැඩි වශයෙන් ඇතුළත් කොට ප්‍රචලිත දේව ශාන්තිකර්ම විශේෂ පළාත් අනුව ගුරුකුල අනුව යම් බඳු වෙනස්කම්වලට බඳුන්ව ව්‍යාප්තව තිබේ. මෙම ස්වරූපය බෙහෙවින් හඳුනාගත හැකිවන්නේ දකුණු පළාතට ආවේණික ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක අතරින් විශේෂ අවධානයට ලක් කළ හැකි, මාතර දිස්ත්‍රික්කය ආශ්‍රිතව ය. ඒ අනුව මාතර දිස්ත්‍රික්කයේ බහුලව පුද ලබන දේව සංකල්ප මුල් කොට ගත් ශාන්තිකර්ම හා ඒවා පාරම්පරිකව පවත්වා ගෙන එනු ලබන ශාන්තිකර්ම ශිල්පීන් පිළිබඳ තොරතුරු මෙන් ම පූජා විධි රටාවට අදාළ ගායනය, වාදනය, සැරසිලි ඇතුළු චත්පිලිවෙත් ක්‍රමවල අන්තර්ගත විශේෂතා අධ්‍යයනය කිරීම මෙම නිබන්ධයේ මූලික අපේක්ෂාව වේ.